# ශ්‍රී ලංකාවේ හිංසනය වැලැක්වීමේ නෛතික සහ ප්‍රතිපත්තිමය ව්‍යුහය පිළිබඳ සමාලෝචනයක්

"අපගේ රජය, සෑමකෙනෙකු තුලම ස්වතන්ත්‍රභාවය පිළිබඳව මායාවක් පවතින බව විශ්වාසකරයි."

ඇන්තනි බර්ගෙස්, ද වෝන්ටිං සීඩ් (*The Wanting Seed)*

## A. හැඳින්වීම

හිංසනයෙන් සහ අමානුෂික සහ ආත්මගරුත්වය කෙළසන හැසිරීම්වලින් නිදහස්ව ජීවත්වීමේ අයිතිය සීමාවකින් තොරව සමස්ථ විශ්වයම පිළිගත් වගකීමකි. මෙම අයිතිය නිසගයෙන්ම පැහැර හැරීම පුද්ගලයෙකුගේ ගරුත්වයට බලපෑම් ඇතිකරන සාධකයකි. තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී සහ ජනතා ශුභසිද්ධිය සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය පාලනය, ජනතාවගේ ගරුත්වයට බලපාන තීරණ සහ ක්‍රියාකාරකම්හි නිරන්තරයෙන් යෙදී සිටී. එමනිසා රාජ්‍ය තීරණ සහ ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා මූලික අයිතිවාසිකම් ව්‍යවස්ථාව තුලින්ම සහතික කර ඇත. රාජ්‍ය පාලනයේ සෑම ආකාරයන් තුලටම සහ සියළු තලයන් තුලටම තම ජනතාවගේ ගරුත්වය ආරක්ෂාකිරීම සහ පවත්වාගෙනයාම පිළිබඳ වගකීම ඇතුලත්කොට ඇත.

මෙම ආකල්ප පත්‍රිකාව මගින් ශ්‍රී ලංකාවේ වඩාත්ම වැදගත් මූලික අයිතිය වන හිංසනයෙන් නිදහස ආරක්ෂාකරන නෛතික සහ ප්‍රතිපත්තිමය ව්‍යුහය සැලකිල්ලට ගෙන ඇත. ශ්‍රී ලංකාව හිංසනය මුළුමනින්ම පිටුදැකීම සනාථකිරීම සඳහා වන දේශපාලනික සහ නෛතික කැපවීමත් ඒ පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාව කෙරෙහි ශ්‍රී ලංකාවේ ඇති බැඳීමත් සම්බන්ධයෙන් ආරක්ෂණ ව්‍යුහය ඇගයීමට ලක් කරනු ලැබේ. විශේෂ සඳහනක් ලෙස ගැටුම් හා සම්බන්ධ විධිවත් හිංසනය පිළිබඳ මෑතකදී වූ හෙළිදරව් සම්බන්ධයෙන්ද අමතා ඇත.

මෙම අයිතිය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිළිබඳව වර්තමාන තත්වය හායනයවූ සහ දුර්වලවූ දේශපාලනික සහ නෛතික අභිප්‍රායක් සහිත චිත්‍රයක් පෙන්වන බව පහත සඳහන්වන සංක්ෂිප්ත විවරණයන් මගින් නිගමනය වේ. විශේෂයෙන්ම පැමිණිලි විමර්ශණය කිරීම, තොරතුරු දැනගැනීමේ අයිතිය, සාක්ෂිකරුවන් සහ වින්දිතයින් ආරක්ෂාකිරීම සහ ප්‍රමාණවත් වන්දි සහ පුනරුත්ථාපනය පිළිබඳව පවතින අඩුපාඩු සහ පවතින නෛතික සහ ප්‍රතිපත්තිමය ව්‍යුහය ක්‍රියාත්මක කිරීම සහ ශක්තිමත් කිරීම පිළිබඳව අවධානය යොමුකර ඇත. මෙහි එන නිර්දේශයන් යොමුකර ඇත්තේ වින්දිතයන්ට සහ ඔවුන්ට සහාය දක්වන්නනන්ට හිංසනයෙන් සහනය ලබාගැනීමේ සහ ඒවා නැවැත්වීමේ සටනේදී ප්‍රායෝගික මෙවලම් ලබාගැනීමට හැකිවන පරිදි යාන්ත්‍රණයන් ආයතනගත කිරීම සහ මෙහෙයවීම පිළිබඳවය.

**B. නෛතික ව්‍යුහය**

## I. ජාත්‍යන්තර බැඳීම්

***ජාත්‍යන්තර ගිවිසුම්***

'හිංසනයට හෝ කෲර, අමානුෂික, ආත්මගෞරවය කෙළසන සංග්‍රහයන් හෝ දඬුවම් වලට කිසිවෙකුත් බඳුන් නොකළ යුතුය' යන සමාජ සහ දේශපාලන හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට (ICCPR) ශ්‍රී ලංකාව අත්සන් තබා ඇත.[1] 1984 දී හිංසනයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියටද (UNCAT) ශ්‍රී ලංකාව අත්සන් තබා ඇත.[2] 'සෑම රාජ්‍යයක්ම තම පාලනය යටතේ පවතින ඕනෑම භූමි ප්‍රදේශයක් තුල පවතින හිංසන ක්‍රියා වැලැක්වීම සඳහා සාධනීය ව්‍යවස්ථාමය, පරිපාලනමය සහ නෛතිකමය සහ අනෙකුත් ක්‍රියාමාර්ග ගත යුතුය[3]' (අවධාරනයෙන් එක්කර ඇත.) යන්න මෙම සම්මුතියේ විශේෂයෙන් සඳහන්ය. ශ්‍රී ලංකාව මෙම ජාත්‍යන්තර සම්මුතීන් ඉටුකිරීම පිළිබඳව මානයන් සෑම සමාලෝචනයකදීම සැලකිල්ලට ගෙන ඇත.

UNCAT සම්මුතියට ශ්‍රී ලංකාවේ ඇති බැඳීම් වලට කැපීපෙනෙන සීමාවන් දෙකක් ඇත. පළමුව, උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි භාරගැනීමේ සහ සැලකීමේ කමිටුව පිළිබඳ යෝග්‍යතාවය හඳුනාගැනීම හා සම්බන්ධ UNCAT සම්මුතියේ 22වන වගන්තියට අනුව කළයුතු ප්‍රකාශණයන් සිදුකර නැත. දෙවනුව, 'හිංසනය නැති කිරීම සඳහා, පුද්ගලයින් රැඳවා තබා ඇති ස්ථාන පරීක්ෂාකිරීම සඳහා අපක්ෂපාතී දේශීය සහ ජාත්‍යන්තර සංවිධාන වලට ක්‍රමවත් අවස්ථාවන් සලසා දීමේ ක්‍රමවේදයක් ඇතිකිරීම' පිළිබඳව වූ වෛකල්පිය මූලලේඛනය ශ්‍රී ලංකාව තවමත් අත්සන් කර නොමැත. බලහත්කාර අතුරුදන්වීම් වලින් සියළුම පුද්ගලයින් ආරක්ෂාකිරීමේ ජාත්‍යන්තර ප්‍රඥප්තියද ශ්‍රී ලංකාව අපරානුමත කර නොමැත.

ශ්‍රී ලංකාවේ හිංසනය සහ ආත්මගෞරවය කෙළසන ක්‍රියාවන්ට එරෙහිව සාධනීය පියවර ගැනීමේ ප්‍රගතිය පිළිබඳව හිංසනයට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුව අවසාන වරට සමාලෝචනය කරන ලද්දේ 2011 වසරේදීය.[4] හමුදාව සහ පොලීසිය විසින් හිංසනයන් සිදුකිරීම් 2011 දක්වාම දිගටම සිදුවී ඇති බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.[5] නෛතික ව්‍යුහය සඳහා ඉදිරිපත්කරන ලද නිර්දේශයන් අතර හිංසනය පිළිබඳව පූර්ණ අර්ථ දැක්වීමක් ලබාදීම, බලහත්කාරයෙන් සිදුකරන අතුරුදහන්වීම් අපරාධ ලෙස සැලකීම සහ සාක්ෂිකරුවන්ගේ සහ වින්දිතයින්ගේ ආරක්ෂාව සනාථ කිරීම ඇතුලත්වන පරිදි 1994 හිංසනයට එරෙහි සම්මුතිය පිළිබඳ පණත සංශෝධනය කිරීම ඇතුලත්විය. ශ්‍රී ලංකාව හිංසනය පිළිබඳ සෑම පැමිණිල්ලක්ම විභාග කිරීමට වහාම පියවර ගතයුතු බවටත්, රැඳවියන්ගේ නෛතික සුරැකිතාව සහතික කළයුතු බවටත්, රහස් රැඳවුම් ස්ථාන හෙලිකිරීමටත්, නිල වශයෙන් රැඳවාගෙන සිටින පුද්ගලයින් පිළිබඳ මධ්‍යම නාම ලේඛනයක් පවත්වා ගැනීමටත්, හිංසනය නැතිකිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් වල සඵලතාවය ඇගයීමටත් සහ අර්ථාන්විත නීතිසහාය සහ පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහතික කිරීමටත් කමිටුව තවදුරටත් නිර්දේශ කරන ලදී. ශ්‍රී ලංකාවේ පස්වන වාර වාර්තාව 2015 නොවැම්බර් මාසයේදී ලබාදීමට නියමිතය.

---

[1] 7 වන වගන්තිය, ICCPR.

[2] හිංසනයට සහ අනෙකුත් කෲර, අමානුශික හෝ ආත්මගරුත්වය කෙළසන කටයුතු හෝ දඬුවම් වලට එරෙහි සම්මුතිය 1984 දෙසැම්බර් 10 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල යෝජනා අංක 39/46 ලෙස සම්මතකර 1987 ජූනි 26 වන දින බලාත්මක කරන ලදී.

[3] 2(1) වගන්තිය UNCAT.

[4] හිංසනයට එරෙහි කමිටුවේ අවසන් නිරීක්ෂණ 2011 දෙසැම්බර් 8 වැනි දින, CAT/C/LKA/CO/3-4

[5] හිංසනයට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුවේ අවසන් නිරීක්ෂණ 2011, 6 වන පරිච්ඡේදය

### *ජගත් වාරික සමාලෝචනය*

ශ්‍රී ලංකාව පිළිබඳ ජගත් වාරික සමාලෝචනය (UPR) 2012 දෙසැම්බර් මාසයේදී සිදුකරන ලද අතර එහිදී පහත සඳහන් නිර්දේශයන්ද ඇතුළුව හිංසනය හා සම්බන්ධ නිර්දේශ ගණනාවක් ලබාදෙන ලදී: වෛකල්පික මූලලේඛනය අපරානුමත කිරීම[6], ජාතික හිංසන වැලැක්වීමේ[7] හෝ ස්වාධීන විමර්ශන යාන්ත්‍රණයක්[8] සකස්කිරීම, ලිංගික හිංසනයද[9] ඇතුළු හිංසනයන් වැලැක්වීමට[10] සහ විමර්ශනයන් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් සම්මත කර ගැනීම, රැඳවුම් ස්ථානවල තත්වයන් වැඩිදියුණු කිරීම[11], සහ රැඳවියන් පිළිබඳව ජනතාවට තොරතුරු ලබාගතහැකි මධ්‍යම නාම ලේඛනයක් ස්ථාපනය කිරීම[12]. මෙම නිර්දේශයන් බොහොමයක් 2008 ජගත් වාරික සමාලෝචනයේදීද සිදුකරන ලද ඒවා වීම මගින් පෙන්වන්නේ වසර හතරක කාලයකට පසුවද මෙම නිර්දේශයන් ක්‍රියාත්මක කර නොමැති බවය.

### *ඉස්තාන්බුල් මූලලේඛනය[13]*

එක්සත් ජාතීන් විසින් අනුමත කරන ලද ඉස්තාන්බුල් මූලලේඛනය "*හිංසනය සහ පීඩාකිරීම් සම්බන්ධයෙන් චෝදනාකරන පුද්ගලයින් පිළිබඳව ඇගයීමට, හිංසන චෝදනා සහිත නඩු විමර්ශනය කිරීමට සහ අධිගමනයන්, අධිකරනයට හෝ වෙනත් විමර්ශණ මණ්ඩලයන් වෙත ඉදිරිපත් කිරීමට* "සුදුසු මාර්ග නිර්දේශයක් ලෙස සැලකේ. මෙම මූලලේඛනය යොදගැනීම පිළිබඳව ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සිදුකරන ලද සමාලෝචනයට අනුව මෙම මූලලේඛනය අභ්‍යන්තරීකරණය කිරීමට දේශපාලන කැපවීමක් නිරීක්ෂණය කර නොමැති අතර ඵලදායී ලේඛනයන් සකස්කිරීම පිළිබඳව අපේක්ෂිත ප්‍රතිඵල දක්නට නොලැබුනි[14]. මෙම මූලලේඛනය හිංසනය පිළිබඳ අවස්ථාවන් හඳුනාගැනීමට, විමර්ශනය කිරීමට සහ සාර්ථකව චෝදනා ඉදිරිපත් කිරීමට උපකාරවන ප්‍රායෝගික මෙවලමක් ලෙස ප්‍රයෝජනවත්ය. පරිපාලනමය බාධාවන් නිසා ශ්‍රී ලංකාව තුල මෙම මූලලේඛනය ක්‍රියාත්මක කිරීමට අධිවාචකයින්ට හැකියාවක් ලැබී නැත.

---

6 UPR නිර්දේශ 2012-128.6. ICC සහ OP-CAT පිළිබඳ රෝම ව්‍යවස්ථාව අපරානුමත කිරීම සහ ජාතික හිංසන වැලැක්වීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම (ඔස්ට්‍රේලියාව); 128.7. OP-CAT(බ්‍රසීලය) අපරානුමත කිරීම; 128.8. හැකි ඉක්මනින් OP-CAT (මාලදිවයින) අපරානුමත කිරීම; 128.9. හිංසනයට සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ ආත්මගරුත්වය කෙලසන කටයුතු හෝ දඬුවම් වලට එරෙහි සම්මුතියට වෛකල්පික මූලලේඛනයට එකඟවීම (චෙක් සමූහාණ්ඩුව).

7 UPR නිර්දේශ 2012-128.6. ජාතික හිංසන වැලැක්වීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම (ඔස්ට්‍රේලියාව)

8 UPR නිර්දේශ 2012-128.60 .2 හිංසනය පිළිබඳ පැමිණිලි විමර්ශණය කිරීම සඳහා ඵලදායී ස්වාධීන මන්ත්‍රකරණ යාන්ත්‍රණයක් ස්ථාපිතකිරීම (පෝලන්තය)

9 UPR නිර්දේශ 2012-128.6. පොලිසිය සහ ආරක්ෂක හමුදාවන් විසින් සිදුකරන පරිභවයන්, හිංසනයන් හෝ අයුතු ලෙස සැලකීම් සියල්ල අඩුකිරීමට සහ වැලැක්වීමට ක්‍රියාකිරීම (ඔස්ට්‍රේලියාව); 128.61. විශේෂයෙන්ම බන්ධනාගාර සහ රැඳවුම් මධ්‍යස්ථාන තුල සිදුවන හිංසනය සහ අයුතු ලෙස සැලකීම් වැලැක්වීමට වැඩිදුර ක්‍රියාමාර්ගයන් සකස්කිරීම (චෙක් සමූහාණ්ඩුව).

10 UPR නිර්දේශ 2012-128.63. හිංසනය සිදුවියහැකි අවස්ථාවන් පිළිබඳව සහ ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන සමග සබඳතා පැවැත්වීම නිසා ප්‍රතිහිංසාවන් සිදුකිරීම පිළිබඳව ස්වාධීන විමර්ශණයන් සිදු කිරීම.(පෝලන්තය); 128.80. ලිංගික හිංසනයන් ඇතුළු මානව හිමිකම් උල්ලංඝනය කිරීම සහ ජාත්‍යන්තර මානවවාදී නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පදවි තානාන්තර නොසලකා ආරක්ෂක හමුදා සාමාජිකයින් සම්බන්ධයෙන් අපක්ෂපාතී පරීක්ෂණ පවත්වා චෝදනා ඉදිරිපත් කිරීම (ඩෙන්මාර්කය)

11 UPR නිර්දේශ 2012-128.76. 2008 මැයිමස පැවති සැසියේදී ඇතිකරගත් එතඟතාවයන්ට අනුව, රැඳවුම් මධ්‍යස්ථානවල තත්වයන් වැඩිදියුණු කිරීම සහ රැඳවියන්ගේ විනිශ්චයක ඇපවීම් වලට ගරුකිරීම, හිංසනයට සහ අමානුෂික සහ ආත්මගරුත්වය කෙලසන කටයුතු වලට එරෙහිව සටන් කරන්නන්ට ගරුකිරීම (ස්පාඤ්ඤය)

12 UPR නිර්දේශ 2012-128.66. අතුරුදහන්වූ සහ අත්අඩංගුවට ගත් සියළුම පුද්ගලයින් පිළිබඳව තොරතුරු මහජනයාට බලාගතහැකි මධ්‍යම නාම ලේඛනයක් වහාම ස්ථාපනය කිරීම. (ජර්මනිය)

13 හිංසනයට සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ ආත්මගරුත්වය කෙලසන කටයුතු හෝ දඬුවම් ඵලදායකව විමර්ශණය කිරීම සහ ලේඛන ගතකිරීම පිළිබඳ කාර්ය සංග්‍රහය.

14 හිංසනය පිළිබඳව ඵලදායකලෙස ලේඛනගත කිරීමේ ඉස්තාන්බුල් මූලලේඛනය ක්‍රියාත්මක කිරීම- ශ්‍රී ලාංකික පර්යාදර්ශය පිළිබඳ සමාලෝචනයක්. පෙරේරා, ක්ලිෆර්ඩ් සහ තවත් අය. අධිකරණ සහ නෛතික වෛද්‍යවිද්‍යා සංග්‍රහය,18වන වෙළුම, 1 වන ප්‍රකාශය, 1-5.

## II. දේශීය නෛතික ව්‍යුහය සහ නීතිම්මාංසය

*ව්‍යවස්ථාමය ඇපවීම*

ශ්‍රී ලංකාවේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හිංසනයෙන් නිදහස පිළිබඳව ඇතුලත්ව ඇත. සියළුම පුද්ගලයින්ට හිංසනයෙන් නිදහස[15] ව්‍යවස්ථාව තුලින් සහතික කර ඇති අතර එය උදුරාගත නොහැකි අයිතියක් ලෙස සඳහන්ව ඇත. එයින් අදහස් වන්නේ හිංසනය හෝ අමානුෂික සහ ආත්මගරුත්වය කෙලසන සංග්‍රහයන් පිළිබඳ අවස්ථාවන්ට දක්වන සීමාවන් ලෙස මහජන සාමය, ජාතික ආරක්ෂාව, සහ අදහස් දැක්වීමේ නිදහස සහ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමට එරෙහි නිදහස සඳහා කෙරෙන සීමාවන් රජයකට ගෙනහැර දැක්විය නොහැකි බවය.

*ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය*

2005 වසරේ සිට ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිම්මාංස අයිතීන් කැපීපෙණෙන ලෙස පහතවැටී ඇති බව 2008 වසරේ සිදුකළ අධ්‍යයනයක් මගින් පෙන්වා දී ඇත[16]. 20011 සිට 2014 කාලය අතරතුර හිංසනය හා සම්බන්ධ විනිශ්චයන් තුනක් ලබාදී ඇති අතර ඒ කිසිවක හිංසනය පිළිබඳ පැහැදිලි සාක්ෂි නොවීය[17]. පෙත්සම්කරුවන් විසින් සිදුකළ යුතුව තිබූ සාධනභාරය ආක්ෂේපනය කිරීම සිදුනොකිරීම මත විනිශ්චයන් පාදක වී තිබුනි. මෙයින් ජනිත වූ නීතිම්මාංසයන් වඩාත් හොඳින් ඇගයීම සඳහා මෙම විනිශ්චයන්ගේ සාධාරනත්වය පිළිබඳව ශාස්ත්‍රීය සමාලෝචනයක් සිදුකර නොමැත.

හිංසනය සම්බන්ධ වන මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු විභාගයන්හිදී පෙත්සම්කරුගේ අයිතීන් දෝෂමුක්ත කිරීම විනිශ්චයන්ට ලක්වී නොමැති අතර බේරුම් කිරීමේ පුරුද්දක් නිරීක්ෂණය කර ඇත. මෙහිදී අධිකරණයෙන් පිටදී අපරාධකරුවන් වින්දිතයා සමග බේරුම් කිරීමක් සිදුවීම නිසා නඩුව අස්කර ගැනීමක් හෝ නඩු විභාගය අත්හිටුවීමක් සිදු වේ. චූදිත අපරාධකරුවන් වරදකරුවන් වීමෙන් ඔවුන්ගේ උසස්වීම් සහ වැටුප් වර්ධක සම්බන්ධ ඇතිවන රැකියා ගැටළු හා ඔවුන්ගේ ජීව වාර්තා කෙලෙසීම නිසා ඔවුන් අධිකරණයෙන් පිටත බේරුම් කරගැනීම් සඳහා පෙළඹේ. මෙම බේරුම් කිරීම් සිදුවන ආකාරය පිළිබඳව අධ්‍යයනයන් සිදුකර නොමැති අතර එය දෙපාර්ශයටම හිතකර එකඟවීමක් හෝ චූදිත අපරාධකරුවා විසින් වින්දිතයින්ට හෝ ඔවුන්ගේ පවුල්වල අයට සිදුකරන බියගැන්වීමක හෝ හිරිහැරකිරීමක ප්‍රතිඵලයක් විය හැකිය. මෙම පුරුද්ද ශ්‍රේෂ්ඨාධිකරණයේ තත්වය ප්‍රතිචාචනය කරන්නකි.

*හේරත් බණ්ඩා එරෙහිව පොලිස් උප පරීක්ෂක*[18] නඩු විභාගයේදී ' *මූලික අයිතිවාසිකම් හා සම්බන්ධ ඉල්ලීම් සාමාන්‍ය පුද්ගලික කරුණු නොවේ'* යන පදනමින් පෙත්සම්කරුට නඩුව ඉල්ලාඅස්කර ගැනීමට අධිකරණය අවසර දී නොමැත. මේ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය මෑතකදී ගන්නාලද ප්‍රවේශයන් තුල හිංසනය පුද්ගලික ආරවුලක් ලෙස සලකා ඇති බව පෙනී යයි. තම පුරවැසියන් ආරක්ෂාකර ගැනීම සඳහාවූ රජයේ වගකීම සහ යුතුකම පිළිබඳව අඩු අවධානයක් යොමුවී ඇති බව පෙනී යයි. ප්‍රසිද්ධියේ උල්ලංඝනය කිරීමේ තත්වය සහ හිංසනය සහ ආත්මගරුත්වය කෙළසන හැසිරීම් රජයට එරෙහි ක්‍රියාවන් ලෙස හඳුනාගෙන නැත.

---

15 1978 ශ්‍රී ලංකා ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය.

16 ශ්‍රී ලංකාව, හිංසනය සිදු නොකිරීමේ අයිතිය, අධිකරණ ප්‍රතිචාර පිළිබඳ විවේචනාත්මක විශ්ලේෂණයක්. කිෂාලි පින්තු ජයවර්ධන සහ ලීසා කොයිස්, 2008 දී නීතිය සහ සමාජය භාරය විසින් ප්‍රකිශ කරන ලදි.

17 18.02.2014 දින තීන්දුව දෙන ලද ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත් අංක 555/2009 (තීන්දුව විනිසුරු එස්. තිලකවර්ධන විසින්), 25.10.2013 දින තීන්දුව දෙන ලද ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත් අංක 278/08 (තීන්දුව විනිසුරු සලීම් මහරූෆ් විසින්), 22.02.2013 දින තීන්දුව දෙන ලද ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත් අංක 431/10 (තීන්දුව විනිසුරු එස්. අයි. ඉමාම් විසින්), 18.11.2013 දින තීන්දුව දෙන ලද ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත් අංක 43/2008 555/2009 (තීන්දුව විනිසුරු එස්. තිලකවර්ධන විසින්).

18හේරත් බණ්ඩාට එරෙහිව පොලිස් උප පරීක්ෂක නඩු අංක (1993) 2 SLR 324 හා සම්බන්ධ විනිසුරු අමරසිංහගේ තීන්දුව.

ශ්‍රේෂ්ඨාධිකරණයට මෑතකදී යොමුකරන ලද මූලික අයිතිවාසිකම් පිළිබඳ ඉල්ලීම් කිහිපයක සඳහන්ව ඇති පරිදි චූදිත අපරාධකරුවන් විසින් වින්දිතයින්ට සහ ඔවුන්ගේ පවුල්වල අයට සිදුකරන ලද තර්ජන සහ බියගැන්වීම් මූලික අයිතිවාසිකම් පිළිබඳ ඉල්ලීම් ගොණුකිරීම් ඇතුළු පැමිණිලි සිදුකිරීමට බලපා ඇත[19]. ඒ අනුව වින්දිතයින්ට සහ සාක්ෂිකරුවන්ට තර්ජනය කිරීම සහ බියගැන්වීම සැබෑ සහ පවතින තත්වයක් වන අතර වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂාකිරීමේ නීතිපැනවීම මගින් මේ පිළිබඳව ඉක්මන් අවධානය යොමුවිය යුතුව ඇත.

තවත් කරුණක් වන්නේ අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් ඉදිරිපත් කරනු ලබන ඔහුගේ/ඇයගේ වෛද්‍ය වාර්තා ලබා ගැනීමට පෙත්සම්කරුවන්ට ඇති නොහැකියාවය. පෙත්සම්කරුට තමාගේම වෛද්‍ය වාර්තාව ලබාගැනීමේ අයිතියක් නොමැති බව පෙනී යයි. තමාගේ වෛද්‍ය වාර්තාවේ පිටපතක් ලබාදීමට අධිකරණ වෛද්‍ය නිලධාරියා ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අවසර පැතූ අවස්ථාවකදී අධිකරණ වෛද්‍ය නිලධාරියාට විරුද්ධව කටයුතු කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රතික්ෂේප කර ඇත[20]. වෛද්‍ය වාර්තාව ඉල්ලාසිටි විට එය අධිකරණය විසින් පමණක් පරිහරණය කළයුතුය යන්න පිලිගත් න්‍යායක් බවට පත්වීම මෙයට හේතුවී ඇත. රෝගියා සහ වෛද්‍යවරයා අතර පැවතිය යුතු රහස්‍යභාවය පිළිබඳ මූලික ප්‍රතිපත්තිය මෙයින් කඩවී ඇත. එමෙන්ම තමාගේ වෛද්‍ය වාර්තාව ලබාගැනීමට හැකියාව ලැබීමෙන් නඩුමාර්ගයට පිවිසීමට අපේක්ෂා කරන්නාට එසේ කිරීම හෝ නොකිරීම පිළිබඳව තීරණයක් කිරීමේ හැකියාව ලැබෙනු ඇත. වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ පසු ඒවායේ රෝග ඉතිහාසය සහ අවශ්‍ය තොරතුරු අඩංගු නැති සංක්ෂිප්ත ඒවා බවත් පැමිණිලිකරු විසින් විස්තර දක්වා ඇති සිද්ධිය සමග තුවාල සම්බන්ධද යන වග පිළිබඳව වෘත්තීයමය ඇගයීමක් සිදුකර නොමැති බවත් බොහෝවිට පෙනී ගොස් ඇත. විභාගයන් නිවැරදිව විනිශ්චය කිරීම සඳහා හෝ ඒසඳහා සහාය වීම සඳහා සර්වව්‍යාපී සහ සවිස්තරාත්මක වෛද්‍ය වාර්තාවන්ද අවශ්‍ය බව ගම්‍යමානවන කරුණකි.

දිවිනසා ගැනීම නිසා පළමු පෙත්සම්කරු මියයාම හේතුකොට ගෙන පෙත්සම්කරුවන් ලෙස වින්දිතයාගේ පවුලේ සාමාජිකයින් අනුයෝජනය කිරීම සඳහා අවස්ථා දෙකකදී ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීම් කර ඇත[21]. මෙම පළමු පෙත්සම් කරුවන්ගේ මානසික තත්වයන් ඇගයීමක් සිදුනොකිරීම අවධානය යොමු විය යුතු කරුණකි. මුහුණදුන් සිද්ධීන් සහ ඉන් පසුව ජීවිතයේ ඇතිවන වෙනස්කම් නිසා කම්පනයෙන් හා විශාදයෙන් පෙලෙන වින්දිතයින්ට සහාය වීමේ ක්‍රමවේදයක් නොමැති වීමද අවධානය යොමුවිය යුතු තවත් වැදගත් කරුණකි.

වරදේ පොදු ස්වභාවය හඳුනාගනිමින්, දරුණුම අපරාධකරුවන්ට පවා හිංසනයෙන් නිදහස්වීමට ඇති අයිතිය ආරක්ෂාකරමින් අවශ්‍යවූ විට නිල වාර්තා ලබා ගැනීමෙන් පෙර පැවති නඩු විභාගවලදී පෙන්වා ඇති ප්‍රතිපත්තීන් ආරක්ෂාකර ගැනීමට සහ ඒ සඳහා ප්‍රතිවර්තනය වීමට නීතිමීමාංසය කටයුතු කළ යුතුය. නඩුමාර්ගයට පිවිසෙන්නන් හට සියුම්වූ වෙනස්කම් සහ අර්ථාන්විත විසඳුම් ගෙනඒම සඳහා ජාත්‍යන්තර සහ සන්සන්දනාත්මක නෛතික විකාශනයන් කෙරෙහිද නීතිමීමාංසය යොමුවිය යුතුය.

සමහර නඩු වලදී මූලික අයිතිවාසිකම් ඉල්ලීම් සඳහා රජය වෙනුවෙන් පෙනීසිටින නීතිපති දෙපාර්තමේන්තුව පක්ෂග්‍රාහීව කටයුතු කරනබව පෙනීගොස් ඇත. හිංසනය හෝ ආත්මගරුත්වය කෙළසන ක්‍රියාවන් පිළිබඳ චෝදනා මත පැමිණිලි කර ඇති රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් ආයතනය පෙනී නොසිටී. එනමුත් ඍජු චොදනා නොලබන ස්ථානභාර නිලධාරීන් සහ නීති උල්ලංඝනය පිළිබඳව එම අවස්ථාවේදී දැනුම්දුන් හෝ ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වූ උසස් නිලධාරීන් වෙනුවෙන් එය පෙනී සිටී.

---

[19] ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත් අංක 194/2012 –සහ 2012 මාර්තු 28 දිනැති දිවුරුම් ප්‍රකාශය සහ 2013 මැයි 21 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය. මෙම නඩුව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ විතර්කයන් සඳහා නියමිතය.

[20] ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත් අංක 194/2012 – විභාගය සඳහා අවසර ප්‍රදානය 2012 නොවැම්බර් 23.

[21] ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත් අංක 278/2008 යටතේ ආදේශනයක් පිලිබඳ ගැටළුව 25.10.2013 දින තීරණය කරන ලද අතර අංක 479/2010 ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ විභාගවීමට නියමිතය.

බොහෝ නඩුවල ඒවා විභාගවන අවස්ථාවලදී පෙත්සම්කරුගේ ඉල්ලීම්වලට විරුද්ධව දෙපාර්තමේන්තුව තර්ක ඉදිරිපත් කරඇත. එහි ප්‍රවේශය ලෙස පෙනී යන්නනේ ඉදිරිපත්වී ඇති පැමිණිල්ල අපක්ෂපාතීව විමර්ශණය කිරීමෙන් තොරව නියෝගදමය ආරක්ෂා කිරීමත් එමගින් චූදිත අපරාධකරුගේ දෑත් ශක්තිමත් කිරීමත්ය.

### *ජාතික මානව හිමිකම් කොමිසන් සභාව (NHRC)*

මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් පිලිබඳ පැමිණිලි භාරගැනීමටත් නිර්දේශයන් ඉදිරිපත් කිරිමටත් ජාතික මානව හිමිකම් කොමිෂන් සභාවට බලය පවරා ඇත. කොමිෂන් සභාවට පත්කිරීම් සිදුකරන්නනේ ජනාධිපති වරයා විසින් පමණක්ය යන 18වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු කොමිෂන් සභාවේ ස්වාධීනත්වය අඩුවීම අවධානය යොමුවිය යුතු කරුණකි.

ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදුකරන නිර්දේශයන්ට නීතිමය බලපෑමක් නොමැති අතර රාජ්‍ය ආයතන, විශේෂයෙන්ම පොලීසිය මෙහි සිදුකරන විමර්ශණයන්ට සහයෝගය නොදක්වන බවට වාර්තාවී ඇත. රාජ්‍ය ආයතන තම නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කිරීමේ හෝ නොසලකා හැරීමේ ප්‍රතිඵලයක් ලෙස ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව වින්දිතයින්ට සහන ලබාගැනීම සඳහා ඵලදායී නොවන ස්ථානයක් බවට පත්වී ඇත. බොහෝ අවස්ථාවලදී වින්දිතයින් ජාතික මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කරන අතරම ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පතක්ද යොමු කරති. එමනිසා ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව මගින් ශ්‍රේෂ්ඨාධිකරණයේ භාරය අඩුකිරීමේ අපේක්ෂාව තවදුරටත් ඉටු නොවී පවතී. සහන ලබාදීම සඳහා ආයතන දෙකක් කටයුතු කරගෙන යන නමුත් මේවායේ නීතිමීමාංසය හිංසනයට ලක්වූ වින්දිතයින්ට උපකාර කිරීමට අපොහොසත්වීම හිංසනයට පත්වූ වින්දිතයන් ආරක්ෂාකර ගැනීම සඳහා වන ඵලදායී නොවන ව්‍යුහයන් පිලිබඳ නිදසුනකි.

කොමිෂන් සභාව විසින් සිදුකරන නිර්දේශයන් නොපිළිපැදීම, පැමිණිලි වලට ක්‍රියාත්මක වීම අඩුවීම, ඵලදායී සමීක්ෂණයන් සිදුකිරීමට අවශය සම්පත් නොමැතිවීම පිළිබඳව අඛන්ඩව මැසිවිලි නැගීම, දුර්වලව සකස්කළ නිර්දේශ සහ ඉතා අඩු වන්දි නිර්දේශ කිරීම තුලින් හිංසනය පිලිබඳව සොයාගත් කරුණුවල බරපතල බව නිසිලෙස වටහා නොගැනීම ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රායෝගිකව අපොහොසත් වීමට හේතුවන කරුණු අතරට ගැනේ[22]. හිංසනයට ගොදුරුවූ වින්දිතයින්ට උපකාර කරන පවුල්වල අය පවසන කරුනු අනුව බොහෝවිට මානව හිමිකම් කොමිෂන් සභාව මගින් සුදුසු ප්‍රතිචාරයක් හෝ මැදිහත්වීමක් සිදුකර ගැනීම අපහසුය. බොහෝ අවස්ථාවලදී සිදුකරන ප්‍රතිචාරය වන්නේ තමාවෙත ලැබුනු පැමිණිල්ල පිලිබඳව අදල පොලිස්ථානයේ ස්ථානභාර නිලධාරිවරයාට දුරකථන ඇමතුමක් ලබාදීම වන අතර එමගින් වින්දිතයන්ට එරෙහිව තවදුරටත් හිංසනයන් කිරීමට අපරාධකරුවන් පෙළඹවීක් සිදුවිය හැකිය.

හිංසනය වැලැක්වීම සඳහා ප්‍රමුඛ කාර්යයක් මානව හිමිකම් කොමිෂන් සභාව සතුය. එනමුත් විමර්ශණ කාර්යයන් සහ වින්දිතයින්ට සහන සැලසීම කෙසේවත් ඵලදයක නොවේ. කොමිෂන් සභාවේ සම්පත් සහ බලය ශත්තිමත් කොට හිංසනය පිටුදැකීම පිළිබඳ කරුණු වලදී ඒ සඳහා උනන්දුවක් දක්වන සිවිල් සංවිධාන සමග එක්ව කටයුතු කිරීමට හැකිවන යාන්ත්‍රණයක් ඇති කිරීමට අවශ්‍යය. ශ්‍රී ලංකාවේ හිංසනය පිටුදැකීම ආමන්ත්‍රණය කිරීමට අවශ්‍ය වැඩසටහනක් දියත්කිරීමට, පොලීසියට සහ අධිකරණ වෛද්‍ය නිලධාරීන්ට අවශ්‍ය නිර්දේශ සකස්කිරීමට සහ නීතිපති දෙපාර්තමේන්තුව සහ අධිකරණය සමග එක්ව හිංසනය නොඉවසන තත්වයක් ඇතිකිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාව අසමත් වී ඇත. කෙසේනමුත් වහාම සිදුකළයුතු සහ නොපමාව ආමන්ත්‍රණය කළයුතු බවට අපේක්ෂාකරන කරුණ වන්නේ කොමිෂන් සභාවේ ස්වාධීනත්වය තහවුරු කිරීමය.

[22] ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අංක HRC/K/70/11/T/A, HRC/415/11 and HRC/1827/11 පැමිණිල්ල සඳහා 2012 ජනවාරි 24 දිනැති නිර්දේශය වූයේ පැමිණිල්ලේ විත්තිකරුවන් තිදෙනාට රුපියල් 5,000ක් ගෙවීමට නියම වීමය. පැමිණිලිකරු සංථාපනීය වෛද්‍ය සාක්ෂි සමග කියා සිටියේ විත්තිකරුවන් විසින් තමාට තලා, පයින්ගසා පොලුවලින්ද පහර දුන් බවය.

## *හිංසනයට එරෙහි ප්‍රතිඥා පනත*

ජාත්‍යන්තර සම්මුතීන් යටතේ අපරාධකරුවන් කෙරෙහි හිංසනය හා ආත්ම ගරුත්වය කෙළසන ක්‍රියාවන් අපරාධයන් ලෙස සැලකීමේ සිය බැඳීම සපුරාලීම සඳහා 1994 වසරේදී හිංසනයට එරෙහි ප්‍රතිඥා පනත[23] (CAT Act) යනුවෙන් දේශීය නීති සම්පාදනය හඳුන්වා දෙන ලදී[24]. මේ අනුව හිංසනය සහ ආත්ම ගරුත්වය කෙළසන ක්‍රියාවන් බරපතල අපරාධයන් ලෙස සලකා මහාධිකරණයක් මගින්[25] විභාගකොට වැරදිකරුවන්ට  වසර හතකට නොඅඩු සහ වසර දහයකට නොවැඩි සිරදඬුවමක් ලබාදීමට සහ රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට යටත් කිරීමට හැකියාව ඇත[26]. මෙම වරද සංඥෙදය සහ ඇප නොදියහැකි වරදක් ලෙසද වර්ගකර ඇත[27].

සිදුකරන ලද නඩුවිභාග සහ ඒවා අවසන්වූ ආකාරය පිළිබඳව සංඛ්‍යා ලේඛන ලබාගැනීම අනපේක්ෂිත ලෙස අසීරු කාර්යයකි. 2010 වසරේදී පරිදි CAT Act යටතේ පණවන ලද නඩු වලින්  ඒත්තු නොයන නඩු තුනක් දෝෂණයෙන් අවසන්ව ඇති අතර 19ක් නිර්දෝෂණය වී ඇත. බොහොමයක් අවසන් නොවූ නඩු ලෙස පවත්වාගෙන ගොස් ඇති බව වාර්තා වී ඇත[28]. 2006 සිට පොලිස් නිලධාරීන්ට එරෙහිව නඩු 529ක් ගොනුකර ඇති බව 2011 දී වාර්තා කර තිබේ[29].

“CAT Act” පණත සඵලත්වයක් නොමැති පණතක් බවට අඛණ්ඩව විවේචන එල්ලවී ඇත. විනිශ්චයකාරවරුන්, වෛද්‍ය නිලධාරීන් සහ හිංසනය පිළිබඳව පැමිණිලි පළමුව ලබාගන්නා පොලිස් නිලධාරීන් විසින් සිදුකළයුතු නිර්දේශයන් සඳහා යොමුකිරීම වැදගත් අංගයකි. නීතිපති දෙපාර්තමේන්තුවේ කැපවීමක් නොමැතිබව පෙනීගොස් ඇත. නිදසුනක් ලෙස ජෙරාඩ් පෙරේරා ඝාතනය සම්බන්ධ නඩුවේදී අදාල පොලිසියේ ස්ථානභාර නිලධාරිවරයා චූදිතයින්ගේ ලේඛනයෙන් ඉවත්කිරීම දැක්විය හැකිය[30]. තවත් නිදසුනක් වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකළ මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු බොහොමයක් පිළිබඳව දැන්වීම් පළමුකොට නීතිපති දෙපාර්තමේන්තුවට යොමුකළ පසු අදාල නිලධාරීන්ට එරෙහිව චෝදනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ක්‍රියා නොකිරීම පෙන්වා දිය හැකිය. 11 වන නියාමිතිය (හිංසනය) උල්ලංඝනය කිරීමේ චෝදනාවන්ට ලක්වීම නිසා රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් පෙනීසිටීම සිදුකළ නොහැකි යයි නීතිපති දෙපාර්තමේනතුව අදහස් කරන්නේ නම් එවැනි පැමිණිලි වැඩිදුර විභාගයන්ට ලක්කර ප්‍රමාණවත් තොරතුරු තිබේනම් අධිචෝදනා ඉදිරිපත් කල යුතු වන්නේය. එනමුත් වර්තමානයේ සිදුවන්නේ මෙය නොවේ. ඇත්ත වශයෙන් කියතොත් අපරාධකරුවන්ට එරෙහිව චෝදනා ඉදිරිපත් කිරීමට කටයුතු කරන්නේදැයි වින්දිතයින්ට හෝ පවුලේ අයට නීතිපති දෙපාර්තමේන්තුවෙන් සොයා බලා දැනගැනීමට අවස්ථාවක් නොමැති බව වින්දිතයින්ට ආධාර කරන සංවිධාන නිතර පැමිණිලි කර ඇත.

---

[23] An Act To Give Effect To The Convention හිංසනයට සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ ආත්මගරුත්වය කෙළසන කටයුතු හෝ දඬුවම් පිළිබඳව වූ සම්මුතිය ක්‍රියාවේ යෙදවීම සඳහා වූ 1994 අංක 22 දරණ පනත.

[24] වගන්තිය 4(1) UNCAT.

[25] 1994 අංක 22 දරණ පනතේ 2(4) ඡේදය.

[26] 1994 අංක 22 දරණ පනතේ 2(4) ඡේදය.

[27] 1994 අංක 22 දරණ පනතේ 2(5) ඡේදය.

[28] නීතිය සහ සමාජ භාරය මගින් ප්‍රකාශකරන ලද 2009-2010 ශ්‍රී ලංකා මානව හිමිකම් වාර්තාව.

[29] හිංසනයට එරෙහි කමිටුවේ 2011 දෙසැම්බර් 8 දිනැති අවසන් නිරීක්ෂණ,  CAT/C/LKA/CO/3-4, 29වන ඡේදය.

30 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවට එරෙහිව සුරේෂ් ගුණවර්ධන සහ තවත් අය නඩු තීන්දුවේ 23 වන පිටුවේ නීතිපති දෙපාර්තමේන්තුව පිලිබඳ විවේචනය, නඩු අංක 326/2003, මීගමුව මහාධිකරණය HCM 02.04.2008.

***හිංසනය සහ ආත්මගරුත්වය කෙළසන ක්‍රියාවන් නිසා ඇතිවන පාඩු සමනය කිරීමට ගන්නා සිවිල් ක්‍රියාකාරකම්.***

හිංසනයේ වින්දිතයින්ට ඇතිවන පාඩු සහ හානි එකී ක්‍රියාවන්ට සෘජුව වගකිවයුතු සහ සම්බන්ධ අයගෙන් ඉල්ලාසිටීමට ශ්‍රී ලංකාවේ සිවිල් නීතිය ඉඩ ලබාදී ඇති නමුත් මෙම සහනය ලබාගැනීමට එළඹෙන්නේ කලාතුරකිනි. දරුණු තුවාල වලට ලක්වූ සිදුවීම් දෙකකදී පමණක්, එක් සිදුවීමකදී අන්ධ භාවයට පත්වීමත්, අනෙක් අවස්ථාවේදි මරණයට පත්විමත්, මෙවැනි අලාභ සහ සහන ඉල්ලලීම් සිදුව ඇත. එය හානිපූරණය කිරීමේ ක්‍රියාවලියේදී පාඩුව තක්සේරුකිරීමේ අයිතිය වින්දිතයාට ලැබෙන සංසදයකි. එනමුත් සිවිල් නඩු කීමේදී සාක්ෂි ලබාදීමට සහ නඩුවිභාග සඳහා අධිකරණයෙහි පෙනී සිටීම සඳහා කාලය මිඩංගුකිරීමේ හිරිහැරය සඳහා වැඩි කැපකිරීමක් කළයුතු වන්නේය. බොහෝ වින්දිතයින්ගේ ආර්ථික පසුබිම සහ මෙවැනි නඩු සඳහා නීති උපදෙස් සහ සහාය ලබාගැනීමේ අපහසුව අනුව මෙම කැපකිරීම ඉතා අපහසු කරුණකි.

**C. ප්‍රතිපත්ති ව්‍යුහය**

මානව අයිතීන් සුරැකීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ජාතික සැලැස්මක් (2011-2016) ශ්‍රී ලංකාවේ අනුමතවී ඇති අතර එහි එක් පරිච්ඡේදයක් හිංසනය පිටුදැකීම සඳහා වෙන් වී ඇත. මැදිහත්වීම සඳහා යොමුවියයුතු ක්ෂේත්‍ර 10ක් හඳුනාගෙන ඇත: නෛතික ව්‍යුහය, අභීක්ෂණය සහ පශ්චාත් සමීක්ෂණය, වැලැක්වීම, මන්ත්‍රකරණය සඳහා ආයතනික යාන්ත්‍රනයක් ඇතිකිරීම, හිංසක අවස්ථාවන් පිලිබඳ පරිගණක දත්ත ගබඩාවක් සකස්කිරීම, දුර්විපාක නොලබා සිටීම සඳහා ආමන්ත්‍රණය කිරීම, ස්ත්‍රීන් සහ ළමුන් සඳහා විශේෂ ආරක්ෂාව, පුණරුත්ථාපනය සහ හානිපූරණය, හිංසනයට එරෙහි ප්‍රඥප්තියක් සකස්කිරීම සහ විදේශයන්හිදී හිංසනයට ලක්වන ශ්‍රී ලාංකික වින්දිතයින්.

ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ තත්වය නිර්නිත කිරීමේ නිල ක්‍රමවේදයක් නොමැත. එසේ වන්නේ පාරදෘශ්‍ය මන්ත්‍රකරනය සහ ක්‍රියාත්මක කිරීම පිලිබඳ විශේෂිත කැපවීමක් ප්‍රකාශකර තිබියදීය[31]. මෙම සැලැස්ම සඳහන්කර ඇති වෙබ් අවකාශයක් පමණක් පිහිටුවා ඇත. සැලැස්මේ හිංසනය පිලිබඳ පරිච්ඡේදයේ කරුණු බොහොමයක් මාස 6ක සිට වසරක කාලයක් ඇතුලත නිමකිරීමට නියමිතය. වසර දෙකකදී සහ පහකදී නිමකිරීම සඳහා කරුනු දෙකක් පමණක් හඳුනාගෙන ඇත. එනමුත් මෙම කරුනු එකක් හෝ අදවනතුරු සම්පූර්ණ කර තිබේදැයි තක්සේරු කිරීම අපහසුය.

රජයේ ප්‍රයත්නය හිංසනය මුළුමනින්ම නොඉවසීමේ ප්‍රතිපත්තියක් වන බව ශ්‍රී ලංකාව පුනර්වාචනය කර ඇත. හිංසනය පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම ඵලදායී නොවීම සහ ඒ සඳහා දේශපාලනික සහ අධිකරණමය කැපවීමක් නොමැතිකම අනුම මෙම ප්‍රතිපත්තිය හිස් ප්‍රකාශයකට සීමා වී ඇත.

31 2011-2016 මානව හිමිකස් සුරැකීම සහ ප්‍රවර්ධනය පිලිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ පිටු අංක 6: '*සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සහ මන්ත්‍රකරණය සඳහා කැබිනට් අනු කමිටුවක් පත් කරනු ඇත. විවිධ අංශවලින් තෝරාගත් ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත මන්ත්‍රකරණ කමිටුවක සහාය ඊට ලබාදෙනු ඇත. අවශ්‍ය අවස්ථාවලදී සිවිල් සමාජය සමග සහ වෙනත් ඕනෑම අංශයක් හෝ වෙනත් ආයතනයක් සමග මන්ත්‍රකරණ කමිටුවට අදහස් හුවමාරුකර ගැනීමේ යාන්ත්‍රණයක් සකස්කෙරෙනු ඇති අතර ඒ හරහා සැලසුම ක්‍රියාත්මක කිරීමේදී බිම් මට්ටමෙහි ඇතිවන ගැටළු කමිටුවට වාර්තා කිරීමේ හැකියාව ඇත.*

*වෙබ් අවකාශයක් සකස්කිරීම මගින් සහ වෙනත් සමාජ මාධ්‍යයන් තුලින් මන්ත්‍රණයේදී පුළුල් පුරවැසි සහභාගීත්වයක් ලබාගැනීමට සහ සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපෝෂණයක් ලබාදීමට පහසුකම් සලසනු ඇත..*"

*'මෙවැනි තත්වයන් කාන්තාවන් ලිංගික අතවරයන්ට අනාවරණය කෙරෙන අතර එමගින් ඔවුන්ගේ ගරුත්වය, ආරක්ෂාව, යහපැවැත්ම සහ අයිතිවාසිකම් කඩකෙරෙන නිසා තිරසාර විසඳුමක් සෙවීමට දරණ ප්‍රයත්නයේදී මෙම කරුණු සැලකිල්කට ගත යුතුව ඇත'* යනුවෙන් දැඩි හමුද ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් ලෙස සිදුවන ලිංගික අතවරයන් පිළිබඳව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා (LLRC) වාර්තාවේ සඳහන්කර ඇත. 'උතුරේ සිදුවී ඇතැයි කියනු ලබන ලිංගික අතවරයන් ඉහලයාම සම්බන්ධයෙන් *සුබසාධන මධ්‍යස්ථානවල කාන්තා පොලිස් නිලධාරිනියන් සහිත කාන්තා ආරක්ෂණ ඒකක සහ කාන්තා මධ්‍යස්ථාන පිහිටුවා ඇති අතර උපදේශන සේවා ලබාදී ඇත*[32]' යනුවෙන් සඳහන් කරන ශ්‍රී ලංකා රජය ඒ අතරම, '*හමුද ක්‍රියාකාරකම් සහ ලිංගික අතවර අතර සහසම්බන්ධතාවයක් පවතින බව පැවසීම අසත්‍යයකි*[33]' යනුවෙන්ද සඳහන් කරයි.

### D. ගැටුම් හා සම්බන්ධ හිංසනය පිළිබඳ ජාත්‍යන්තර වාර්තා

විශේෂයෙන්ම අල්ලාගත් සාමාජිකයින්ට සහ ඔවුන්ගේ පවුල්වල අයට සිදුවූ ලිංගික අතවර සහ අත්අඩංගුවේ සිටියදී මියයාම ඇතුළු විධිවත් හිංසනයන් පිළිබඳ වාර්තා ගණනාවක් ඇත[34]. මෙම වාර්තා තුල කාරක අධ්‍යයනයන් සහ වෛද්‍ය සාක්ෂි සහිත විධිවත් හිංසනයන් පිළිබඳව සඳහන් කර ඇත.

### D. හිංසනය මුළුමනින්ම නොඉවසීමේ ප්‍රතිපත්තියක් සහිත පාලන ක්‍රමයක් සඳහා නිර්දේශ

#### <u>නීතිකාරක වෙනස්කිරීම් හා සම්බන්ධ නිර්දේශ</u>

#### (1) හිංසනයේ වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂාකිරීමේ නීති සම්පාදනය

මෙම කරුණ පිලිබඳව නීති සම්පාදනයේ වගකීම සම්මුතීන් මගින් ස්ථාපිත කර ඇති අතර එහි අවශ්‍යතාවය ජාතික සැලැස්ම තුලින් හඳුනාගෙන ඇත. වින්දිතයින් සහ සාක්ෂිකරුවන් තර්ජනකිරීම් සහ කරදරකිරීම් වලින් පුළුල්ව ආරක්ෂාකිරීම සඳහා නීති සම්පාදනය සිදුකිරීම අවශ්‍යවන අතර අදල බලාත්මක කිරීමේ කාර්යාංශයන් තුල අනුගාමී ස්වාධීන සහායක ව්‍යුහයන් පැවතීමේ අවශ්‍යතාවයද එම නීතිවලට ඇතුලත්විය යුතුය.

හිංසනය පිලිබඳ චෝදනාවක් එල්ලවූ විට චූදිත අපරාධකරුවන් නඩුව අවසන් වන තුරු වෙනත් ස්ථානයක රැඳවීමට වහාම පියවර ගැනීම සිදුකළ යුතු ආරක්ෂක අවශ්‍යතාවයකි. මෙයටත් වඩා වැදගත් වන්නේ බියවැද්දීම සහ හිරිහැර කිරීම සම්බන්ධයෙන් පැමිණිලි කළ හැකි ස්වාධීන අධිකාරිය පිලිබඳව සහ එම වැරදි වලට දඬුවම් දීම ප්‍රසිද්ධියට පත් කිරීමය.

---

[32] ජගත් වාරික සමාලෝචන කාර්ය කණ්ඩායමේ 2012 දෙසැම්බර් 18 දිනැති A/HRC/22/16 වාර්තාවේ 'සමාලෝචනය කරන ලද රජයේ ඉදිරිපත්කිරීම' යන මැයෙන් වූ කොටසේ 17 වන ඡේදය.

[33] Ibid

[34] 2014 එක්සත් ජාතීන්ගේ මනව හිමිකම් කමිටුවේ 112 වන සැසිවාරය සඳහා ජාත්‍යන්තර ක්ෂමා ආයතනයේ සැලකර සිටීමේ පිටු අංක 10 සිට 15 දක්වා බලන්න. එය පහත සඳහන් වෙබ් ලිපිනයෙන්

බාගත හැකිය: http://www.amnesty.org/fr/library/asset/ASA37/011/2014/en/4c09c88e-a298-4cba-bdee-4b6a077ef55a/asa370112014en.pdf.

නිම නොවූ යුද්ධය: ශ්‍රී ලංකාවේ හිංසනය සහ ලිංගික තාඩනය 2009-2014, යස්මින් සූකා, එංගලන්තයේ සහ වේල්සයේ මානව හිමිකම් කට්ටුවේ නීතිඥ මඩුල්ල (BHRC) සහ ජගත් සත්‍යය සහ සාධාරණත්ව ව්‍යාපෘතිය, ශ්‍රී ලංකාව.

හිංසනයෙන් නිදහස, 'නිහඬතාවයෙන් ඔබ්බට: ශ්‍රී ලංකාවේ පවතින හිංසනය පිළිබඳ නව සාක්ෂි 2009-2014 පහත සඳහන් වෙබ් ලිපිනයේ ඇතුලත්ය:
http://www.freedomfromtorture.org/feature/out_of_the_silence/5980

## (2) ත්‍රස්තවාදය වැලැක්වීමේ පණත (1979) අවලංගු කිරීම

ත්‍රස්තවාදය වැලැක්වීමේ පණත දිගටම පවත්වාගෙන යාම හිංසන ක්‍රියාවන් දිරිගැන්වීමට සහ ආරක්ෂාකිරීමට හේතුවී ඇත. එක්සත් ජාතීන්ගේ හිංසනයට එරෙහි කමිටුව දක්වා ඇති පරිදි 'ත්‍රස්තවිදය වැලැක්වීමේ පනතේ ඇති නීතිවල පිරිසැරුම් ස්වභාවය සංවේග දයකය[35]' සහ 'සහකාර පොලිස් අධිකාරිවරයෙකු (ASP) හෝ ඊට ඉහල නිලයක පොලිස් නිලධාරියෙකු විසින් ලබාගන්නා පාපෝච්චාරනයන් පිළිගතහැකි සාක්ෂි ලෙස සැලකීම (16වන ඡේදය) සහ එය ලබාගන්නා ලද්දේ බලහත්කාරයෙන් බව ඔප්පුකිරීමේ සාධන භාරය චූදිතයාගේ වගකීමක් කිරීම (17වන ඡේදය)[36]' සහ 'ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ ගොනුකළ බොහෝ නඩු වල එකම සාක්ෂිය මෙම පාපෝච්චාරනයන් වීම[37]'. සැලකිය යුතු කරුණු වන්නේය. මෙවැනි නීතිවල ප්‍රතිපාදන තුලින්ම හිමිකම් උල්ලංඝනය වීම් වැඩිවීමට ඇති හැකියාව නිසාම ඒවා ඉවත්කිරීම අත්‍යාවශ්‍ය කරුණක් වන්නේය.

## (3) වින්දිතයින්ට සහ ඔවුන්ගේ නියෝජිතයින්ට වෛද්‍ය වාර්තා ලබාගැනීමට හැකිවන කොන්දේසි ඇතුලත් වන පරිදි නීති සම්පාදනය.

හිංසනය පිළිබඳ පැමිණිලි පරීක්ෂාකිරීමේදී අධිකරණ වෛද්‍ය නිලධාරියාගේ සොයාගැනීම් පිළිබඳ වාර්තාවේ පිටපතක් පොලීසියට සහ අධිකරණයට පමණක් ලබාදීම සාම්ප්‍රදායික පුරුද්දකි. පුරුද්දක් ලෙස මෙම වාර්තා පැමිණිලිකරුට හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයෙකුට ලබාගැනීමට නොහැකි වීම සහ විශේෂයෙන්ම එය පොලිසියට ලබාදීම රෝගියාගේ රහස්‍යභාවය සුරැකීමේ මූලික ප්‍රඥප්තිය උල්ලංගනය කිරීමකි. එමෙන්ම මෙය පැමිණිලිකරුගේ තොරතුරු දැනගැනීමේ මූලික අයිතිය උල්ලංඝනය කිරීමක් වන අතර ඔහුට/ඇයට නිසිපරිදි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඇති අවස්ථාවද අහිමි කරවයි.

<u>**විධායකයට ලබාදෙන නිර්දේශ**</u>

## (4) විධිමත් සමාලෝචන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සහ පවත්වාගැනීම

(i) හිංසනය වැලැක්වීමේ අරමුණෙන් සිරභාරයට ගැනීම් සහ අත්අඩංගුවට පත්වන, රැඳවා තබාගන්නා සහ බන්ධනාගාර ගත කරන පුද්ගලයින් හා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන පරිප්‍රශ්නන නීති, උපදෙස් සහ භාවිතයන් සෑම රජයක් විසින්ම සමාලෝචනය කළයුතු බව ප්‍රඥප්තියේ 11 වන වගන්තියෙන් ප්‍රකාශ කර ඇත. ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි අවධානය යොමුවී ඇත්තේ හිංසක අවස්ථාවන් පිළිබඳ පරිගණක දත්ත ගබඩාවක් සකස්කිරීම පිළිබඳව පමණකි.

(ii) ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් වන මූලික අයිතිවාසිකම් ඉල්ලුම්පත් සිදුකළ හැකි අධිචෝදනයන් සම්බන්ධයෙන් හිංසනයට එරෙහි ප්‍රතිඥ පනත (CAT Act) අනුව සමාලෝචනය කිරීම.

(iii) විමර්ශණයන් සඳහා සහ අවශ්‍යනම් චෝදනා ගොනුකිරීම සඳහා තම යෙමුකිරීම් කෙලින්ම නීතිපති දෙපාර්තමේන්තුවට ලබාදෙන ලෙස හිංසනය පිළිබඳ පැමිණිලි අනාවරණය කරන අධිකරණ වෛද්‍ය නිලධාරීන් වෙත ආඥාවන් නිකුත්කිරීම.

[35] ශ්‍රී ලංකාවේ හිංසනයට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුවේ අවසන් නිරීක්ෂණ 2011, 10 වන ඡේදය.

36 ශ්‍රී ලංකාවේ හිංසනයට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුවේ අවසන් නිරීක්ෂණ 2011, 11 වන ඡේදය.

37 Ibid

**(5) හිංසනය පිළිබඳ පැමිණිලි සහ අධිකරණ තීරණ සම්බන්ධව ජාතික ප්‍රතිචාර ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම.**

(i) රජයේ නිලධාරීන්ගේ වරදින් හිංසනයේ වින්දිතයින්ට සිදුවන අවමානය සහ සමහරවිට ඔවුන්ගේ ජීවිතකාලයටම ඇතිවන කම්පනයට ප්‍රමාණවත්ව සහ යෝග්‍යපරිදි වන්දි ගෙවීම සඳහා ජාතික අරමුදලක් පිහිටුවිය හැකිය.

(ii) හිංසනයේ වින්දිතයින් සඳහා ශාරීරික සහ මානසික ප්‍රතිකාර සහිත පුණරුත්ථාපන වැඩසටහනක් රජයේ අනුග්‍රහයෙන් ලබාදිය යුතුය.

(iii) හිංසනයේ පැමිණිලිකරුවන් සඳහා වටිනා සහ නෛතිකව පිළිගන්නා පූර්ණ සහ උචිත වෛද්‍ය පරීක්ෂණයක් සිදුකිරීම සහතික කරනු සඳහා රජයේ අනුග්‍රහයෙන් ස්වාධීන වෛද්‍ය සහ මනස්-සමාජ ඇගයීමක් සිදුකළ යුතුය.

**(6) ඉස්තාන්බුල් සම්මමුතිය පිළිගැනීම**

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අදාල අධිකරණ වෛද්‍ය නිලධාරියාගෙන් නෛතික වෛද්‍ය වාර්තාව ලබාගැනීමට රෝගියාට ඇති අයිතිය ඇතුළු හිංසනය ලේඛනගත කිරීම පිළිබඳ ඉස්තාන්බුල් සම්මුතිය පිළිගෙන ක්‍රියාත්මක කිරීම.

**(7) නීතිය ක්‍රියාත්මක කරන නිලධීරීන්ගේ දැනුවත්බව වැඩිකිරීම**

ජාත්‍යන්තර බැඳීම් වල සඳහන්වන ආකාරයට රාජ්‍යයන් *'නීතිය ක්‍රියාත්මක කරන සිවිල් හෝ හමුදමය පුද්ගලයින්, වෛද්‍ය වෘත්තිකයින්, රජයේ නිලධාරීන් සහ හිරභාරයේදී, පරිප්‍රශ්නනයේදී හෝ ඕනෑම ආකාරයක අත්අඩංගුවට ගැනීමේදී, රඳවා තබාගැනීමේදී හෝ බන්ධනාගාර ගතකිරීමේදී සහභාගීවන අය පුහුණු කිරීමේදී හිංසනයට එරෙහි වාරනයන් පිළිබඳ අධ්‍යාපනය සහ තොරතුරු පූර්ණවශයෙන් ඇතුලත්කළ යුතුය.*[38] *'* මෙම පුද්ගලයින්ගේ රාජකාරි සහ වෘත්තීය කාර්යයන් සඳහා නීති සහ කාර්යපටිපාටීන් සකස්කළ යුතු බවද මෙම බැඳීම් තව දුරටත් සඳහන් කරයි[39]. සංසන්දනාත්මකව ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් වන්නේ හිරභාරයට ගැනීමේ, පරිප්‍රශ්නනයේදී සහ අත්අඩංගුවට ගැනීමේ ක්‍රමවේදයන් පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ හැකියා වර්ධනය සහ ජනතාව දැනුවත් කිරීම සම්බන්ධයෙන් පමණකි. රජය සඳහන් කරන 'හිංසනයෙන් තොර' ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ නීති හෝ ක්‍රමවේද පිළිබඳව එහි සඳහනක් නොමැත.

**(8) ප්‍රඥප්තියේ 22 (1) වගන්තියට අනුකූල ප්‍රකිශයන් ශ්‍රී ලංකාව විසින් සිදුකිරීම**

මෙම මූලික පිළිගැනුම අනුව හිංසනයට එරෙහි කමිටුව මගින් පුද්ගලික පැමිණිලි සලකා බැලීම සහ එම පැමිණිලි මෙම විෂය පිළිබඳ ජාත්‍යන්තර නීති මීමාංසයන්ට අනුකූලවූ රාජ්‍ය ප්‍රතිචාර අනුව සලකා බැලෙනු ඇත. එයින් අදහස් වන්නේ සංසන්දනාත්මක අත්දැකීම් අනුව දේශීය නීති ශක්තිමත් කිරීමය.

**(9) ප්‍රඥප්තියට අනුව වෛයිකල්පීය මූලලේඛනය අපරානුමත කිරීම**

හිංසනය වැලැක්වීම පිළිබඳ උප-කමිටුවට දේශීය රැඳවුම් ස්ථාන බැලීමට යාමේ නීත්‍යානුකූල බලය වෛයිකල්පිය මූලලේඛනය මගින් පිළිගන්නා අතර රජය මගින් හිංසනය වැලැක්වීමේ ස්වාධීන ජාතික ක්‍රමවේදයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය සඳහන් කරයි.

[38] 10 වන වගන්තිය (1) UN CAT
[39] 10 වන වගන්තිය (2) UN CAT

## (10) ගැටුම් සහ හමුද පරිපාලනය හා සම්බන්ධ හිංසනය විමර්ශනය කිරීම

(i) ඉහතින් සඳහන් කරනලද විවිධ වාර්තාවල අඩංගු මෙම චෝදනා වගකීමේ යාන්ත්‍රණයේ කොටසක් වශයෙන් විමර්ශණය කළ යුතුය.

(ii) ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ අධික හමුද ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස සිදුවන ලිංගික හිංසනයන් පිළිබඳ කරුණු සම්බන්ධයෙන් කටයුතු කරන කාන්තා ආරක්ෂණ ඒකක සහ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන වෙත ලැබී ඇති පැමිණිලි අධ්‍යයනය කර සමාලෝචනය කළ යුතු අතර මෙම නිහඬ තත්වය වටහාගැනීම සහ ඒ සඳහා යොමුවීම අවශ්‍යය.

## (11) ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ කිරීම.

<u>**අධිකරණ සහ නෛතික ප්‍රතිචාර දියුණු කිරීම සඳහා නිර්දේශ**</u>

(11) ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ හිංසනයේ ප්‍රවර්ථකයින් කෙරෙහි ඇති බැඳීම් පිළිබඳව සහ හිංසනය පිළිබඳ පැමිණිලි වලට යෝග්‍ය පරිදි සහ සාධනීය ලෙස සහන සැලසීමේ රජයේ වගකීම පිළිබඳව විනිසුරුවන් සහ නීතීඥයින් අතර දැනුවත්බව වැඩිකිරීම.

(a) ශ්‍රී ලංකාවේ හිංසනය හා සම්බන්ධ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ මහාධිකරණයේ විනිශ්චයක උපනතීන් ගේ අධ්‍යයනයන් පිළිබඳ සොයාගැනීම් හුවමාරු කර ගනිමින් සාකච්ඡාවන් ඇතිකිරීම සහ ඒවා ජාත්‍යන්තර ප්‍රමිතීන් සමග සැසඳීම.

(b) 11වන වගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් දෙනලද විනිශ්චයන්ට අනුව හිංසනයට එරෙහි ප්‍රතිඥ පනතට (CAT Act) අනුකූලව අදල නිලධාරීන්ට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව කටයුතු කිරීම අවශ්‍යය.

(c) අධිකරණ විචාරණයන් සඳහා ලිඛිත සහ වාචික සැලකරසිටීම් වලදී නීතිඥයින් විසින් ජාත්‍යන්තර ප්‍රමිතීන් උපුටා දැක්වීම.

(d) වින්දිතයින් හිංසනයට ලක්වීම නිසා සිදුවූ අහිමිවීම් සහ හානි වන්දි වශයෙන් නැවත ලබාගැනීම සනාථ කිරීමට නීතිඥයින් විසින් සිවිල් ක්‍රියාකාරකම් සඳහා පෙළඹවීම.

<u>**මහජන දැනුවත්කිරීම් පිළිබඳ නිර්දේශ**</u>

(12) හිංසනය මුළුමනින්ම පිටුදැකීමේ රජයේ ප්‍රතිපත්තිය පිලිබඳව, හිංසනය වැලැක්වීමේ ජාතික හිමිකම් ව්‍යුහය සහ පැමිණිල්ලක් කිරීමට අවශ්‍යවූ විට ගතයුතු පියවර පිළිබඳව මහජන දැනුවත්බව ඉහල නැංවීම.

(13) හිංසනයේ වින්දිතියන්ගේ ප්‍රකාශ සටහන්කර ගැනීම පොලිස් ස්ථාන විසින් ප්‍රතික්ෂේප කිරීමේ අවස්ථාවන්ට එරෙහිව ගන්නා පියවරක් ලෙස ආරක්ෂිත සහ අපක්ෂපාතී මහජන පැමිණිලි ලබාගැනීමේ ක්‍රමවේදයක් ලබාදීම.

**E. සමාප්තිය**

1994 සිට ශ්‍රී ලංකාවේ හිංසනයෙන් නිදහස්වීම ආරක්ෂාකිරීමේ නෛතික සහ ප්‍රතිපත්තිමය ව්‍යුහය සත්තාවත් ලෙස අක්‍රියව පවතී. සාමාන්‍යයෙන් ජාත්‍යන්තර සමීක්ෂණයන්ට සහ සමාලෝචනයන්ට ප්‍රතිචාර වශයෙන් මෙම අයිතීන් සුරැකීම සඳහා වන කැපවීම ශ්‍රී ලංකාව විසින් වර්න් වර පුනර්වාචනය කර ඇත. හිංසනය 'මුළුමනින්ම පිටුදැකීමේ ප්‍රතිපත්තිය' යන යෙදුම ශ්‍රී ලංකාව විසින් යොදාගෙන ඇත. එනමුත් ඉහතින් දැක්වූ පරිදි මෙම නිදහස සාක්ෂාත් කර ගැනීමේ බරපතල අඩුපාඩු ඇත.

ස්වතන්ත්‍රභාවය පිලිබඳ මායාවක් ඇතිකිරීමේ වෑයම පිලිබඳව ඇන්තනි බර්ගෙස් ගේ ප්‍රකාශය සිත් ඇදගන්නා සුළුය. රජයන් විසින් සිදුකරන්නේ එයම බව පෙනීයයි. කෙසේනමුත් හිංසනයෙන් නිදහස්වීම පිලිබඳ සැලකීමේදී ශ්‍රී ලංකාවේ අප එවැනි මායාවක් තුල හෝ ජීවත්වන බවක් නොපෙනේ. රජය වෙනස්වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම බලගතු අවශ්‍යතාවය කෙරෙහි දේශපාලන කැපවීම සහ අධිකරණයේ ඉඩහසර ලබාගැනීමට හැකිවේදැයි අපේක්ෂාවෙන් බලාසිටිය යුතුය.